# දඹාන ප්‍රදේශයෙන් හමු වූ ටෙරාකොටා ස්ථානය පිළිබඳ හැඳින්වීමක්

**ජයම්පත් සේනානායක, ප්‍රිශාන්ත ගුණවර්ධන, හරේන්ද්‍රලාල් නාමල්ගමුව, මෙලාති සල්ඩින්[1], නලීන් දීපාල් මුණසිංහ[2]**

ශ්‍රී ලංකාවේ මැටි රූප කලාව (ටෙරාකොටා) පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා වසර 85 ක පමණ කාලයක් දැනට ගෙවී ඇත. මෙම කාල රාමුව තුළ ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වලින් මැටි රූප කලාව ව්‍යාප්තව තිබූ බවට සාධක රැසක් අනාවරණය වී ඇත. පුරාවිද්‍යාත්මක ගවේෂණ අනුව ටෙරාකොටා මැටි රූප හමු වී ඇති ස්ථාන 30 ට පමණ ආසන්න ප්‍රමාණයක් සොයාගෙන ඇත. ඒ අතරින් දැනට පුරාවිද්‍යාත්මක කැණීම් සිදු කොට විද්‍යාත්මක කාලනිර්ණයන් ඉදිරිපත් කර ඇත්තේ ස්ථාන දෙකක් සඳහා පමණි. ඒවා නම් අනුරාධපුර දීස්ත්‍රික්කයේ නිකවැව හා රාජාංගනය යන ස්ථාන සඳහා ය. නිකවැව ටෙරාකොටා ස්ථානය ඉහළ මල්තු ඔය පුරාවිද්‍යා ගවේෂණ ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කළ අතර එම ස්ථානයේ කැණීම් මගින් ලබාගත් ප්‍රතිඵල සඳහා ක්‍රිස්තු වර්ෂයෙන් 10 වන සියවසට අයත් බවට OSL දින නියමයන් ලැබී ඇත. එමෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් කැණීම්කළ රාජාංගනය සඳහා කාබන් 14 කාලනිර්ණයට අනුව 10 වන සියවසට හා 11 වන සියවසට අයත් වන බවට දින නියම කර ඇත.

මෙම විද්‍යාත්මක දින නිර්ණයන් සමග ශ්‍රී ලංකාවේ ඓතිහාසික සමාජ විපර්යාසයන් සංසන්දනය කර බැලීමේදී තම අනාගත ජීවිතය හා බැඳී පැවති විවිධ ක්‍රියාකාරකම් සාර්ථක කරගැනීම උදෙසා පවත්වාගෙන ගිය පූජා විධි ක්‍රමයක් මෙම සංස්කෘතිය තුළින් පිළිඹිබුවන බව අනුමාන කළ හැකිය. මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වන්නේ දඹාන ගම්මානයට ආසන්න ගල්කඩ ටෙරාකොටා ස්ථානය පිළිබඳ විමසීමක් ඉදිරිපත් කිරීමය. මෙම ස්ථානයේ සිට නැගෙනහිර පළාත් සීමාවට ඇත්තේ

---

[1] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

[2] ආදිවාසී ජනඋරුම කේන්ද්‍රය

කිලෝමීටර් 10 ක් පමණ දුරකි. නැගෙනහිර පළාතේ ටෙරාකොටා ස්ථාන අතරින් කෝමාරි සහ අම්පාර යන ස්ථාන දැනට හඳුනාගෙන ඇත. ගල්කඩ ස්ථානයේ මතුපිට පොළවෙන් ලැබෙන මැටි රූපවල ශෛලීන් සහ ඒවායේ ස්වභාවයන් ශ්‍රී ලංකාවේ අනෙකුත් ස්ථානවලින් හමුවී ඇති රූපවලට බෙහෙවින් සමානත්වයක් දරයි. මෙම පුරාවිද්‍යාත්මක ස්ථානය මත දැනට නිවසක් පිහිටා ඇති බැවින් මුදා ගැනීමේ පුරාවිද්‍යා කැණීමක් සිදු කොට මෙහි තොරතුරු වාර්තාගත කිරීම
අත්‍යවශ්‍ය වේ.

**ප්‍රමුඛ පදඃ** ටෙරාකොටා, දඹාන ප්‍රදේශය, පූජා විධි ක්‍රම
**Title:** An introduction to a terra cotta site found in Dambana region
**Keywords:** terra cotta, Dambana, ritual offerings